(c) www.sinhalalyrics.com

රණ දෙරණේ ගිනි අවිගත් යුද සෙබළුනි අසනු මැනව
වෙඩි උණ්ඩය වැයකොට නුඹ සුරැකිය යුතු ජන පිරිසය
යුක්තිය උදෙසා මොරදෙන ජනයා නසතොත් වියරුව
වැනසෙන්නේ නුඹද අයත් පංතිය බව සිතට ගනුව

ඉලක්කයට ලක්වන විට රුදු මරණයේ ඉරණම් කරු
බලව සිතා එක මොහොතක් වරද කිමද ඔහුගෙ රුදුරු
වැටුපට මිනි මරන දනන් නොව නුඹලා මිනිසුනේ ගරු
අයුක්තියේ අණ පිළිපැද කුමටද නුඹ පළඳින තරු

මානන ගිණි දණ්ඩ තුලින් පෙනෙන තරුණ පපු කුහරය
අධම කැළක කට අද දින නහර පිනන රස අහරය
උන්ගෙ බහට නිදොස් දනන් මරතොත් යුද සෙබළ සගය
පමා කරන්නේ නුඹ හෙට නැගෙන්ට යන නව අරුණය

පද රචනය - සුනිල් ආරියරත්න
සංගීතය - සරත් දසනායක